සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Provincial Department of Education - NWP**

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

**තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2023**
**Third Term Test - Grade 13 - 2023**

විභාග අංකය: ......................................

# ක්‍රිස්තියානි ධර්මය - I

**කාලය පැය 02 යි**

- අංක 01 - 50 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමේ දී නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ඊට අදාළ අංකය ප්‍රශ්නය ඉදිරියෙහි ඇති වරහනෙහි යොදන්න.
- උපදෙස් :- මෙම ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සැපයිය යුතුය. එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100 කි.

---

01. දොතාන් යන ස්ථානයෙහි වැදගත්කම වනුයේ,
    (1) ජොෂියා රජු ඝාතනය කරනු ලැබූ ස්ථානය.
    (2) දාවිත්, රජු ලෙස අභිෂේක කල ස්ථානයයි.
    (3) ජෝශප්ව ඉස්මායෙල්වරුන්ට විකුණූ ස්ථානයයි.
    (4) ස්නාවක ජොහාන්තුමාගේ උපත සිදුවූ ස්ථානයයි.
    (5) එළියා දිවැසිවරයා හා බාල් පූජකියන් පිළිබඳ සිද්ධිය වූ ස්ථානයයි. (.........)

02. හදවතක හැඩය ගන්නාවූ මුහුද වන්නේ,
    (1) කින්නරෙක් මුහුද (2) මළ මුහුද (3) මධ්‍යධරණී මුහුද
    (4) ගොලු මුහුද (5) රතු මුහුද (.........)

03. සාමුවෙල් විසින් ජනතාවට සාවුල්ව රජුලෙස හඳුන්වා දුන් ස්ථානය වන්නේ,
    (1) ගිඩියොන් (2) දෝහාන්
    (3) ජොප්පාව (4) මිස්පා
    (5) ඒලෝන් ගස අසල. (.........)

04. පූජක එස්රාගේ කාර්යය සඳහන් නිවැරදි වරණය තෝරන්න
    (A) විදේශීය භාර්යාවන්ට ඉඩකඩ සැලසීම.
    (B) ගිවිසුම අලුත් කිරීම.
    (C) ව්‍යවස්ථාවලිය කියවීම.
    (D) සබත් නිවාඩුව ක්‍රියාත්මක කිරීම.
    (E) නටබුන් වූ වාසස්ථාන ගොඩනැගීම.
    (1) ABCD (2) BCD (3) CBE (4) DBA (5) ACE (.........)

05. ඇන්ටෝනියා මාළිගය තම නිවසක් ලෙස පිහිටුවා ගත්තේ,
    (1) පොන්තියුස් පිළාත් (2) අර්කෙලාවුස් (3) හෙරෝද් පිලිප්
    (4) මහා හෙරෝද් (5) හෙරෝද් ඇන්ටිපස් (.........)

06. දේව වචනයට මුල්තැනක් දී කටයුතු කිරීම අවශ්‍ය බව පෙන්වා දෙන සම්ප්‍රදායකි,
    (1) වාචික (2) යාවිස්ත (3) එලොහිම්
    (4) ද්විතීය නීති (5) පූජක (.........)

07. පංච පුස්තකය රචනාවීම ආරම්භ වූයේ
    (1) ක්‍රි.පූ. 10 වන ශතවර්ෂයේදී
    (2) ක්‍රි.පූ. 08 වන ශතවර්ෂයේදී
    (3) ක්‍රි.පූ. 07 වන ශතවර්ෂයේදී
    (4) ක්‍රි.පූ. 06 වන ශතවර්ෂයේදී
    (5) ක්‍රි.පූ. 05 වන ශතවර්ෂයේදී (.........)

08. මැවීම පිළිබඳ පළමු කථාවට අනුව සූර්‍යයා හා චන්ද්‍රයා නම්කර තිබුනේ නැත. ඊට හේතුව වූයේ,
(1) සූර්‍යයා හා චන්ද්‍රයා මවන ලද්දේ දින හත අවසානයේ නිසා.
(2) මෙම කථා පුවත රචනා වී ඇත්තේ බහු දේවවාදී පරිසරයක එයට විරුද්ධව නිසා.
(3) සූර්‍යයා හා චන්ද්‍රයා සඳහා නම් එම කාලයේ භාවිතා නොවූ නිසා.
(4) මැවීමේ සිද්ධිය ආරම්භ කිරීමට පෙර සූර්‍යයා හා චන්ද්‍රයා පැවති නිසා.
(5) සූර්‍යයා හා චන්ද්‍රයා වෙනුවට ලොකු ආලෝකය හා කුඩා ආලෝකය යන නම් භාවිතය පහසු වූ නිසා. (.........)

09. මැවීමේ දෙවන කතාවට පසුබිමක් සපයන ලද්දේ ,
(1) නික්මයාමේ සිද්ධිය
(2) දින හතක් තුළ දේව මැවිල්ල නිම කිරීමේ සිද්ධිය.
(3) ආදි මව්පියන්ගේ සිද්ධිය.
(4) කායින් හා ආබෙල්ගේ සිද්ධිය.
(5) දස පනත ලබාදීමේ සිද්ධිය. (.........)

10. දූවිල්ල සඳහා යෙදෙන හේබ්‍රෙව් වචනය වන්නේ,
(1) රාදා (2) අබාද් (3) ෂාමාර් (4) ෂාලොම් (5) ආපාර් (.........)

11. පැරණි ගිවිසුම තුල පැවති දිවැසිවරයෙහි ඇති විශේෂත්වය වන්නේ,
(1) දිවැසිවරයා තම කාර්යයෙහි ප්‍රධාන කොට ග්‍රන්ථයක් ලිවිය යුතු වීම.
(2) දේව පණිවිඩය ජනතාවට ප්‍රථම පැවති රාජ්‍ය පාලකයාට දැනුම් දිම.
(3) එකම දෙවියන් වහන්සේගේ නියෝජිතයන් ලෙස දේව පණිවිඩය ප්‍රකාශ කිරීම.
(4) පෙර සිටි දිවැසිවරුන්ගේ ක්‍රියා කලාපය අනුගමනය කිරීම.
(5) දිවැසි වදන් ප්‍රකාශ කිරීමේදී පදමාලා තුනම භාවිත කිරීම. (.........)

12. ක්‍රි.පූ. 734 -732, සීරෝ - එප්‍රායිම් යුද සමයේ අසිරියානු අධිරාජ්‍යයා වූයේ,
(1) තෙවන තිග්ලත් ප්ලේසර් (2) පළමුවන අහ්මෝස්
(3) ඊෂ් බොෂෙත් (4) සිව්වන ඇන්ටිඕකස් එපිපානස්
(5) මහා ඇලෙක්සැන්ඩර් (.........)

13. ජෙරුසලෙම් වැසියන් හට යෙසායා කළ මෙහෙය ආරම්භ වුයේ,
(1) ජොෂියා රජ අපවත්වූ වර්ෂයේදී.
(2) උශ්ෂියා රජ අපවත්වූ වර්ෂයේදී.
(3) ශෙදකියා රජ අපවත්වූ වර්ෂයේදී.
(4) සයිරස් රජ අපවත්වූ වර්ෂයේදී.
(5) ජෙහොවාකිම් රජ අපවත්වූ වර්ෂයේදී. (.........)

14. සමහර බයිබල් විශාරදයන්ට අනුව ප්‍රඥා සාහිත්‍යයේ ආරම්භය වන්නේ,
(1) සලමොන් රජතුමාගෙනි (2) රාජ්‍ය සභාවෙනි (3) දේව මාළිගාවෙනි
(4) සාමාන්‍ය පවුල් පරිසරයෙනි (5) ප්‍රභූ පන්තියෙනි (.........)

15. ගීතාවලියෙහි ගීත වර්ගීකරණයෙහි වන්දනා ගමන් සඳහා භාවිත වූ ගීත හඳුන්වා ඇත්තේ මේ නමිනි,
(1) ප්‍රඥා ගීත (2) රාජකීය ගීත (3) සියෝන් ගීත
(4) විලප ගීත (5) තුති දීමේ ගීත (.........)

16. දේශපාලන කණ්ඩායමක් ලෙස ක්‍රියා කරමින්, හෙරෝදගේ පෙළපතින් පැවතෙන්නෙකු තම ආණ්ඩුකාරයා වනු ඇතැයි අපේක්ෂා කළ පිරිස වන්නේ,
(1) සෙලට්වරු (2) හෙරෝදිවරු (3) පරිසිවරු
(4) සදිසිවරු (5) එසීනවරු (.........)

17. " සිනගෝගය " යන ග්‍රීක වචනයේ අරුත වන්නේ,
(1) ජනතාව නගා සිටුවීම (2) ජනතාව නායකත්වය ගැනීම
(3) ජනතාව බලගැන්වීම (4) ජනතාව එකතු කිරීම
(5) ජනතාව කණ්ඩායම් කිරීම. (.........)

18. දේව නමස්කාරයට පෙර සිදු කළ යුතු වූ ප්‍රධාන කාර්යය වූයේ,
(1) ගිවිසුම් පොත කියවීම. (2) හිස මුඩු කිරීම.
(3) සුදු වස්ත්‍ර ඇඳීම. (4) අත් පා සේදීම.
(5) වස්ත්‍රවල දාවල්ල පළල් කිරීම. (.........)

19. ශු. මාර්ක් සුබරංචියේ කර්තෘ පේදුරුතුමාගේ සහයක හා භාෂා පරිවර්තක ලෙස ක්‍රියා කළ මාර්ක් නැමැත්තෙකු බව දක්වන සභා පියවරුන් වන්නේ,
(1) පැපියස්, ඉරනේයස් හා ඔරිගන් තුමන්ලා.
(2) ශු.ජස්ටින්, ජෙරම්, හා ඉරනේයස් තුමන්ලා.
(3) ඔරිජන්, ටර්ටුලියන් හා සිරිල් තුමන්ලා.
(4) ඇන්සලම්, බෙඩික් හා පැපියස් තුමන්ලා.
(5) විනිෆ්‍රිඩ්, බොනිෆස් හා ටර්ටුලියන් තුමන්ලා. (.........)

20. සමදර්ශක ශුභාරංචි හා ජොහාන් ශුභාරංචිය යන සියල්ලම වාර්තා කරන ප්‍රාතිහාර්යයන් සඳහන් පිළිතුර වන්නේ,
(1) පන්දහසකට කෑම දීම, ජාත්‍යන්ධයෙකුට පෙනීම දීම.
(2) බෙත්සයිදා නුවර කොර මිනිසා සුව කිරීම, මුහුද මත ඇවිදීම.
(3) වතුර මිදියුෂ බවට පත් කිරීම, ලාසරස් මරණින් නැගිටුවීම.
(4) පන්දහසකට කෑම දීම. මුහුද මත ඇවිදීම.
(5) වතුර මිදියුෂ බවට පත් කිරීම, ජාත්‍යන්ධයෙකුට පෙනීම දීම. (.........)

21. ශුභාරංචි පණිවිඩය නොපිළිගන්නාගේ ඉරනම වඩා දරුණු විය හැකි බව ශු.මතෙව් සුවිශේෂයේ පෙන්වා දෙනු ලබන්නේ පුරාණ ගිවිසුමේ මෙම සිදුවීම ඇසුරිනි,
(1) බාබෙල් කොත (2) නෝවා හා ජලගැල්ම
(3) බබිලෝනියානු විප්‍රවාසය (4) අසිරියානු විප්‍රවාසය
(5) සොදොම් හා ගොමෝරා නගර (.........)

22. නිධානය, මුතු ඇටය යන උපමා දෙකෙහිම පිළිබිඹු වන මූලික ඉගැන්වීම වන්නේ,
(1) දෙවියන් වහන්සේ ප්‍රතික්ෂේප කරන්නවුන් වෙත පැමිණෙන භයානක ඉරණම පිළිබඳව.
(2) අපගේ ක්ෂණික වූත් පරිත්‍යාගශීලී වූත් ප්‍රතිචාරය ඉල්ලා සිටින බව.
(3) අවසානයේදී දමිටුන්, අදමිටුන්ගෙන් වෙන් කර ඒ ඒ අයට සුදුසු විපාක දෙන බව.
(4) විනිශ්චයේ තීරණ අනුව ප්‍රතික්ෂේප කරනු ලැබීමෙන් සන්තාපය හටගන්නා බව.
(5) දේව රාජ්‍යය සුළුවෙන් හා අදෘෂ්‍යමාන ලෙස ආරම්භ වී කල්යත්ම ප්‍රකාශයට පත් වන බව.

23. පිලාත් ආණ්ඩුකාර ධූරය දරණ ලද ප්‍රදේශ ඇතුලත් පිළිතුර වන්නේ,
(1) ජුදය, සමාරිය,ඉදුමීය.
(2) ගලීලය, පෙරයාව, සමාරිය.
(3) බෙත්සයිදාව, මද්ගලාව, බෙතානිය.
(4) කයිසාරිය, පෙරයාව, කපර්ණවුම
(5) ජෙරුසලම, ගලීලය, මද්ගලාව (.........)

24. එපීසයේදී ශු.පාවුලු තුමාට මුහුණ දීමට සිදුවූ සිදුවීමකි,
(1) බාරයක් වෙනුවෙන් හිස මුඩු කර ගැනීම.
(2) ආත්මයක් ආවේශ වීමෙන් පේන කීමෙහි යෙදුණු වහල් ස්ත්‍රියක් සුව කිරීම.
(3) සිරගෙදරදී පාද දඬු කඳන් වල ගසා බොහෝ රැකවල් මැද තබනු ලැබීම.
(4) පාවුලුතුමාගේ දේශනා නිසා දෙමෙත්‍රියස්ගේ රිදී රූප අලෙවිය කඩා වැටීම හේතුකොටගෙන කෝලාහලයක් ඇතිවීම.
(5) යුතිකස් නම් තරුණයාට නැවත පණ ලබා දීම. (.........)

25. පාවුලුතුමා , " සමාන ස්වරූපය "යන වචනය සඳහා භාවිත කරන"ඊසා " යන වචනයේ තේරුම වන්නේ,
(1) ක්ෂණික වෙනස් වීම යන්නය.
(2) දේවත්වය පමණක් අන්තර්ගත යන්නය.
(3) ඕනෑම පරිසරයක වෙනස් නොවන යන්නය.
(4) ලෝකෝත්තර ස්වභාවය මත ඇති වෙනස්වීම යන්නය.
(5) සිය කැමැත්තෙන් වෙනස් වූ බව යන්නය. (.........)

26. කුඩා පෙන්තකොස්තයක් ලෙස දක්වන සිද්ධිය වන්නේ,
(1) ජේසුස් වහන්සේ යෙසායාගේ ග්‍රන්ථය ප්‍රකාශ කිරීම.
(2) ජේසුස් වහන්සේ පරීක්ෂා ජය ගැනීම.
(3) ජේසුස් වහන්සේ ජලය මිදි යුෂ බවට පත් කිරීම.
(4) ජේසුස් වහන්සේව බෞතිස්ම ස්නාපනය කිරීම.
(5) ජේසුස් වහන්සේගේ අන්‍ය රූප විලාශ වීම. (.........)

27. ගීතාවලියේ දෙවන ගීතය ........................................ දී ගයන ලද්දකි,
(1) විලාපයක
(2) රාජාභිෂේකයක
(3) ස්තුතියක
(4) ප්‍රශංසාවක
(5) කමාව යැදීමක (.........)

28. ප්‍රසාද ස්නාපනය ලැබූ හැම කිතුණුවෙකුටම පැවරෙන ත්‍රිවිධාකාර කාර්යභාරයන් වන්නෙ,
(1) දිව්‍යසිවර, සභා ඒකත්වය, සාධාරණත්වය.
(2) පූජක, සාධාරණත්වය, යුක්තිය.
(3) සාමය. රාජකීය, ඒකත්වය.
(4) එඬේරික, පූර්ණත්වය, පූජක.
(5) පූජක, දිව්‍යසිවර, එඬේරික (.........)

29. ජේසුස් වහන්සේ මුහුණ දුන් පරීක්ෂා තුළින් අවධාරණය වන ලෞකික ගුණාංගය වන්නේ,
(1) බලය, කීර්තිය, ධනය
(2) ධනය, ප්‍රසිද්ධිය, පරමාධිපත්‍යය
(3) පරමාධිපත්‍ය, ගෞරවය, ලෞකික සැපත
(4) කීර්තිය, ව්‍රත ශුද්ධිය, බලය
(5) බලය, නිහතමානි බව, ධනය (.........)

30. ග්‍රීක බසින් 'ශරීරය' යන වචනය සඳහා භාවිතා වන වචනය වන්නේ,
(1) සාර්ක්ස් (2) ත්‍රෝගයින් (3) සෝමා
(4) ෂාලොම් (5) ක්‍රිස්ටොස් (.........)

31. උපස්ථායකයන් හා සම්බන්ධ සාවද්‍ය ප්‍රකාශය වන්නේ,
(A) - උපස්ථායකයන් සත් දෙනෙක් සිටි බව.
(B) - සහනාධාර බෙදීම සිදු කල බව.
(C) - ඔවුන්ව තේවාචාර්යවරු ලෙසද හඳුන්වා ඇති බව.
(D)- ඔවුන් සියලු දෙනාම ශුභ අස්න ද දේශනා කළ බව.
(E) - ශුද්ධාත්මයෙන් හා ප්‍රඥාවෙන් ඔවුන් පූර්ණ වූ බව.
(1) B (2) D (3) E (4) A (5) C (.........)

32. "අන්න ස්වර්ගය විවර වී තබෙනවාත්, මනුෂ්‍ය පුත්‍රයා දෙවියන් වහන්සේගේ දකුණු පස සිටිනවාත් මට පෙනේ " යයි නොබියව ප්‍රකාශ කළේ,
(1) මහා ජාකොබ් තුමා (2) පේදුරු තුමා
(3) පාවුලු තුමා (4) ස්තේපන් තුමා
(5) ජොහාන් තුමා (.........)

33. ශු. ජුවාන් තුමාව පැට්මෝස් දූපතට පිටුවහල් කළ අධිරාජ්‍යය සමය වන්නෙ,
(1) නීරෝ අධිරාජ්‍යය සමය. (2) ට්‍රාජන් අධිරාජ්‍යය සමය.
(3) මාකස් අවුරේලියස් අධිරාජ්‍යය සමය. (4) මැක්සිමිනස් අධිරාජ්‍යය සමය.
(5) ඩොමිෂියන් අධිරාජ්‍යය සමය. (........)

35. කතෝලික සභාවේ සාම්ප්‍රදායික ඇදහිල්ලේ පියා ලෙස හඳුන්වන්නේ,
(1) ශු. වූ ජස්ටින් තුමා (2) ශු. වූ සිරිල් තුමා
(3) ශු. වූ අතනාසියුස් තුමා (4) ශු. වූ ග්‍රෙගරි තුමා
(5) ශු. වූ ජෙරෝම් තුමා (.........)

36. පෙලාජියස් නම් බ්‍රිතාන්‍ය ජාතික තාපසයාගේ ඉගැන්වීම වූයේ,
(1) මිනිසාගේ මනුෂ්‍ය ස්වභාවය ජන්ම පාපය මගින් විනාශ වී ඇති බව.
(2) ක්‍රිස්තුස් වහන්සේ දෙවියන් වහන්සේගේ ප්‍රථම මැවිල්ල බව.
(3) ක්‍රිස්තුස් වහන්සේට සැබෑ දිව්‍යමය ස්වරූපයක් නොමැති බව.
(4) එකම සදාතන දෙවිකෙනෙක් ඇති බව.
(5) ගැලවීම රඳාපවතින්නේ දේව වරප්‍රසාදය අනුව බව. (.........)

37. දිව්‍ය පූජාව තුළට ග්‍රෙගෝරියානු සජ්ඣායනා ක්‍රමය (නව සංගීත ක්‍රමය) අතුළත් කළ පාප්තුමා වන්නේ,
(1) දෙවන ජුවම් පාවුලු පාප් තුමා (2) පළමු ලියෝ පාප් තුමා
(3) මහා ග්‍රෙගරි පාප් තුමා (4) බෙනඩික් පාප් තුමා
(5) ෆ්‍රැන්සිස් පාප්තුමා (.........)

38. නමවන සියවස තුළ කිතුණු සභාව හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශ සහිත වරණය වන්නේ,
(A) - අභ්‍යන්තර හා ගෝත්‍රික ආක්‍රමණ හේතුවෙන් අධිරාජ්‍යයේ බලය හීන වීම.
(B) - බුද්ධිමය පරිහානියක් හා ආත්මික පරිහානියක් ඇතිවීම.
(C) - ස්ලැවික් ගෝත්‍රික ජනතාවට නව අක්ෂර මාලාවක් හඳුන්වා දීම.
(D) - ෆිලියෝක්වේ වගන්තිය නයිසීන විශ්වාස ලක්ෂණයට එකතු වීම.
(E) - ශු. සභාව හා රජය අතර අරගල ඇති වීම.
(1) A, B, C (2) B, C, D (3) C, D, E (4) A, C, D (5) A, B, E (.........)

39. 1856 දී ගැලවීමේ හමුදාව ආරම්භ කළේ,
(1) මාටින් ලූතර් තුමා (2) විලියම් බූත් තුමා
(3) ජෝන් කැල්වින් තුමා (4) උල්රිච් ස්වින්ග්ලි තුමා
(5) ජෝන් වෙස්ලි තුමා (.........)

40. මිනිස්කමට ගරු කළ යුතු බවත්, දිළින්දන් හා ධනවතුන් අතර උස් පහත් භේදය තුරන් විය යුතු බවත් අවධාරණය කෙරෙන විශ්ව ලේඛනය වන්නේ,
(1) ලෝක සාමය (2) අනිත්‍රීය ක්‍රිස්තු දේහය
(3) කිතුනු අධ්‍යාපනය (4) රේරුම් නොවාරුම්
(5) මව හා ගුරුවරිය (.........)

41. "කොලීජි " නමින් උසස් පාසල් අරඹමින් උසස් අධ්‍යාපනයට අවස්ථාව ලබා දුන් නිකාය වන්නේ,
(1) ජේසු නිකායික පියවරුන් (2) අගෝස්තීනු නිකායික පියවරුන්
(3) නිමල මරිය නිකායික පියවරුන් (4) දොමිනිකාන නිකායික පියවරුන්
(5) ෆ්‍රැන්සිස්කාන නිකායික පියවරුන් (.........)

42. ශ්‍රී ලංකාව පාලනය කළ පෘතුගීසීන් නිසා මෙරටට ඇති වූ ප්‍රතිඵලයකි,
    (1) අවිධිමත් පාසල් අධ්‍යාපනයක් ආරම්භ වීම.
    (2) ජන ජීවිතයෙන් සෞන්දර්යය දුරස් වීම.
    (3) බහු විවාහ ක්‍රම ස්ථාපිත කිරීම.
    (4) පුණ්‍ය ආයතන බිහි වීම.
    (5) බටහිර වෛද්‍ය ක්‍රමය පසු බැමට ලක්වීම. (.........)

43. පුංචි රෝමය ලෙස හැඳින් වූ ග්‍රාමය වන්නේ,
    (1) හලාවත (2) වෙන්නප්පුව
    (3) යාපනය (4) මන්නාරම
    (5) සිල්ලාලේ (.........)

44. " දෙවිඳු උපන්නේ ය සතුනි " යන ගීතිකාව නිර්මාණය කළ පියතුමා වන්නේ,
    (1) ජුසේවාස් පියතුමා (2) ජෝන් විලා ද කොන්දේ පියතුමා
    (3) ජාකෝමේ ගොන්සාල්වේස් පියතුමා (4) සීමන් ද කොයිම්බ්‍රා පියතුමා
    (5) අන්තෝනියෝ පද්‍රාම් පියතුමා (.........)

45. ගරු ජේම්ස් කාටර් දේවගැතිවරයා බ්‍රිතාන්‍ය යටත් විජිත ආණ්ඩුකාරවරයාගේ සහයෝගය මත ආරම්භ වූ සභාව වූයේ,
    (1) ලන්ඩන් සභාව (2) මෙතෝදිස්ත සභාව
    (3) වෙස්ලියන් සභාව (4) බැප්ටිස් සභාව
    (5) ඇමරිකන් සභාව (.........)

46. අතිගරු පීටර් බියෙන්වෙනු නොආයි පියතුමා විසින් ආරම්භ කරන ලද පැවිදි නිකාය වන්නේ,
    (1) ද ලා සාල් නිකාය
    (2) ශුද්ධ වූ පවුලේ පැවිදි නිකාය
    (3) යහපත් එඬේරාගේ පැවිදි නිකාය
    (4) මරිය තුමියගේ ෆ්‍රැන්ඩිස්කන පැවිදි නිකාය
    (5) නිර්මල මරිය නිකාය (.........)

47. මනුෂ්‍යයාගේ උතුම්කම රඳා පවතින්නේ,
    (1) නිදහස් කැමැත්ත මත (2) ක්‍රියා කිරීමේ හැකියාව මත
    (3) තීරණ ගැණීමේ හැකියාව මත (4) වැඩිහිටි උපදෙස් මත
    (5) හෘද සාක්ෂිය මත (.........)

48. විවාහ දිවියේ පරිශුද්ධත්වය පිළිබඳව පවසන්නේ,
    (1) ශුද්ධ වූ පේදුරු තුමා (2) ශුද්ධ වූ ජාකෝබ් තුමා
    (3) ශුද්ධ වූ පාවුලු තුමා (4) ශුද්ධ වූ ජොහාන් තුමා
    (5) ශුද්ධ වූ මතියස් තුමා (.........)

49. මිනිසත් කම උදෙසා කාලය, ශ්‍රමය හා ධනය වැය කළයුතු බව පෙන්වා දෙන උපමාව වන්නේ,
    (1) යහපත් සමරිතානුවරයාගේ උපමාව
    (2) චපුරන්නා පිළිබඳ උපමාව
    (3) දැල පිළිබඳ උපමාව
    (4) පරිසිවරයා හා අයකැමියා පිළිබඳ උපමාව
    (5) නිධානය පිළිබඳ උපමාව. (.........)

50 ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය යටතේ ලියා පදිංචි වී ඇති කිතුනු සභා ගණන වන්නේ,
    (1) 7 කි (2) 6 කි
    (3) 9 ති (4) 8 කි
    (5) 5 කි (.........)

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2023
Third Term Test - Grade 13 - 2023

විභාග අංකය: ....................................

# ක්‍රිස්තියානි ධර්මය - II

කාලය පැය 03 යි

- පළමු කොටසින් ප්‍රශ්න දෙකක් ද දෙවන කොටසින් ප්‍රශ්න තුනක් ද තෝරාගෙන පිළිතුරු ලියන්න.

## I - කොටස

01. (i) පැරණි දිවැසිවරුන් කළ කී දේ සඳහන් ග්‍රන්ථ දෙක සඳහන් කරන්න. (ල. 02)

(ii) ශාස්ත්‍රීය දිවැසිවරුන් බෙදෙන ප්‍රධාන කොටස් දෙක හා උදාහරණ දෙකක් සඳහන් කරන්න. (ල. 04)

(iii) යෙසායා දිවැසිවරයාට අනුව සාම රාජ්‍යයේ උදාවත් සමග දෙවියන් වහන්සේ ගේ ආත්මානුභාවය මෙසියස් වහන්සේ තුළ පතිත වීමෙන් ඇතිවන ප්‍රතිඵල තුනක් ඉදිරිපත් කරන්න. (ල. 06)

(iv) අභියෝගාත්මක වත්මන් සමාජ රටාව තුළ තරුණ කිතුණු ඔබගේ දිවැසිවර කාර්ය කරුණු හතරක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ල. 08)

02. (i) පෙන්තකොස්ත දිනයේ දී සිදු වූ සිදුවීම් දෙකක් ලියන්න. (ල. 02)

(ii) මුල් කිතුණු සභාවේ ලක්ෂණ හතරක් නම් කරන්න. (ල. 04)

(iii) උපස්ථායක පිලිප් තුමා සමාරියේ කළ සේවාවන් තුනක් සඳහන් කරන්න. (ල. 06)

(iv) අභිවෘද්ධි ආලේප ලබමින් ශක්තිමත් වූ බව ශුද්ධවු සභාවේ අභිවෘද්ධිය උදෙසා ඉටුකරන කාර්යයන් හතරක් ලියා විස්තර කරන්න. (ල. 08)

03. (i) ශුද්ධ බයිබලීය චින්තනයට අනුව අනෙක් මැවිලි වලට වඩා මිනිසා උතුම් වීමට හේතු දෙකක් නම් කරන්න. (ල. 02)

(ii) ක්‍රිස්තුස් වහන්සේගේ දූත සේවාවේ දී අනුගාමී වූ කාන්තා චරිත හතරක් ලියන්න. (ල. 04)

(iii) ශුධවී පාවුළු තුමාට අනුව කිතුණු විවාහයේ පාරිශුද්ධත්වය පිළිබඳ ඉගැන්වීම් තුනක් විස්තර කරන්න.

(iv) කිතුණුවකු ලෙස පරිසරය සුරැකීමේ වගකීම ඔබ ක්‍රියාවට නංවන්නේ කෙසේ දැයි කරුණු හතරකින් පෙන්වා දෙන්න. (ල. 08)

## . II කොටස

04 (i) උතුරු - දකුණු රාජ්‍ය භේදය ඇති වීම කෙරෙහි සලමොන් රජතුමාගේ පාලනය බල පෑ ආකාරය කරුණු පහකින් විස්තර කරන්න. (ල. 10)

(ii) ශිෂ්‍ය නායක - නායිකාවන් ලෙස කිතුණු ඔබ පාසල තුළ වගකීම් දරමින් කටයුතු කරන ආකාර පහක් පැහැදිලි කරන්න. (ල. 10)

05. (i) දෙවියන් වහන්සේ විසින් මෝසස් තුමා කැඳවන අවස්ථාවේදී එම කැඳවීම මෝසස් තුමා පස් වතාවක් ප්‍රතික්ෂේප කළ ආකාරයත් දෙවියන්වහන්සේ එතුමාව ධෛර්මත් කළ ආකාරයත් විස්තර කරන්න. (ල. 10)

(ii) මෝසස් තුමාගේ කැඳවීම තුළින් තරුණ කිතුණු ඔබට ලැබෙන මග පෙන්වීම් පහක් ලියා විස්තර කරන්න. (ල. 10)

06. (i) ලූක් සුභාරංචියට ආවේනික ලක්ෂණ පහක් උදාහරණ ඉදිරිපත් කරමින් පැහැදිලි කරන්න. (ල. 10)

(ii) "සුභාරංචි කතුවරුන් ක්‍රිස්තුස් වහන්සේ නැමති සුභාරංචිය පතළ කිරීමට සිය කෘතීන් මගින් දරා ඇති වෙහෙස අපමණය" කරුණු පහක් ඉස්මතු වන සේ පැහැදිලි කරන්න. (ල. 10)

07. (i) නව වන සියවස තුළ බටහිර අධිරාජ්‍යයේ සිදු වූ විශේෂ සිදුවීම් පහක් ලියා විස්තර කරන්න. (ල. 10)

(ii) " සභාව තුළ ආත්මික නවෝදයක් ඇති කිරීම සඳහා මධ්‍යතන යුගයෙන් පසුව බිහිවූ තාපස නිකායන් " යන මැයෙන් කතෝලික පුවත් පතක එල කිරීම සඳහා ලිපියක් සකසන්න. ( කරුණු පහක්වත් ඇතුලත් විය යුතුය)

08. (i) බ්‍රිතාන්‍ය යුගයේ දී ශ්‍රී ලංකාවේ කිතු දහම ව්‍යාප්ත කිරීමට පැමිණි ධර්මදූත කණ්ඩායම් පහක් නම් කර විස්තර කරන්න. (ල. 10)

(ii) වත්මන් සමාජ අර්බුද හමුවේ කිතුණු අනන්‍යතාවය සුරකිමින් පවතින තත්වය වෙනස් කිරීමට තරුණ කිතුණු ඔබ කරන යෝජනා පහක් විස්තර කරන්න. (ල. 10)

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# තෙවන වාර පරීක්ෂණය 2023
# ක්‍රිස්තියානි ධර්මය

**12 ශ්‍රේණිය** — I කොටස — **පිළිතුරු පත්‍රය**

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. ( 3 ) | 02. ( 1 ) | 03. ( 4 ) | 04. ( 2 ) | 05. ( 4 ) | 06. ( 4 ) | 07. ( 1 ) | 08. ( 2 ) | 09. ( 1 ) | 10. ( 5 ) |
| 11. ( 3 ) | 12. ( 1 ) | 13. ( 2 ) | 14. ( 4 ) | 15. ( 3 ) | 16. ( 2 ) | 17. ( 4 ) | 18. ( 4 ) | 19. ( 1 ) | 20. ( 4 ) |
| 21. ( 5 ) | 22. ( 2 ) | 23. ( 1 ) | 24. ( 4 ) | 25. ( 3 ) | 26. ( 4 ) | 27. ( 2 ) | 28. ( 5 ) | 29. ( 1 ) | 30. ( 3 ) |
| 31. ( 2 ) | 32. ( 4 ) | 33. ( 5 ) | 34. ( 1 ) | 35. ( 3 ) | 36. ( 1 ) | 37. ( 3 ) | 38. ( 4 ) | 39. ( 2 ) | 40. ( 5 ) |
| 41. ( 1 ) | 42. ( 4 ) | 43. ( 5 ) | 44. ( 3 ) | 45. ( 4 ) | 46. ( 2 ) | 47. ( 5 ) | 48. ( 3 ) | 49. ( 1 ) | 50. ( 4 ) |

**I කොටස**

01 (i) එළියා, එළිෂා, නකාන්, හුල්දා, අහියා ( 60 පිටුව) (ලකුණු 1 **x** 2 = 2 යි)

(ii) ප්‍රධාන දිවැසිවරු - යෙසායා, ජෙරමියා, එසකියල්
සුළු දිවැසිවරු - හොසියා, ජෝවෙල්, ආමොස්, ඔබදියා, ජෝනා, මීකා (61 පිටුව)(ලකුණු 2 **x** 2 = 4 යි)

(iii) ප්‍රඥාව - යුක්ති සහගත හා නිවැරදිව ජිවිතයට මුහුණ දීමේ හැකායාව
නුවන - දේව කැමැත්ත තෝරා බේරා ගැනීමේ හැකියාව
අනුශාසනා බුද්ධිය - තව කෙනෙකු හරි මග පෙන්වීමේ හැකායාව (63 පිටුව)

(iv) සිසුන් ලියා ඇති කරුණු සලකා ළකුණු ලබා දෙන්න.

02 (i) ★ ගිනි දළු වැනි ........ බෙදී ගොස් එකිනෙකා මත පිහිටීම. ★ බිය ඉවත්ව යාම
★ අන්‍ය භාෂා කථනය ★ සියලු දෙනා ඉදිරියේ දේශනා කිරීම
(පිටු අංක 10)

(ii) ★ ඉකුත්වීම ★ සහභාගීකම ★ රොටි කැඩීම ★ යාච්ඥාව (පිටු අංක 10)

(iii) ★ සුභාරංචිය ප්‍රකාශ කිරීම
★ අශුද්ධාත්මය දුරු කිරීම
★ රෝගීන් සුව කිරීම
★ බෞතීස්ම ස්නාපනය (පිටු අංක 12)

(iv) සිසුන් ලියා ඇති කරුණු සලකා ළකුණු ලබා දෙන්න.

03 (i) ★ බුද්ධිය ★ ප්‍රඥාව ★ දේවසමානකම ★ හෘද සාක්ෂිය ★ අමරණිය ආත්මය (පිටු අංක 88)

(ii) ★ මාර්තා මරියා ★ සමරිතාන් ස්ත්‍රීය ★ මහ්දලාහී මරියා ★ කුදු ස්ත්‍රීය (පිටු අංක 90)

(iii) ★ ස්වාමිපුරුෂයා හා භාර්යාන අතර තිබිය යුතු සබඳතාවය ......... හා සභාව අතර ඇති සබඳතාවය සමාන කිරීම.
★ දරුවන් දෙමාපියන් වෙත දැක්විය යුතු යුතුකම් හා වගකීම් පෙළ ගැස්සීම.
★ දෙමාපියන් විසින් දරුවන්ට දැක්විය යුතු යුතුකම් හා වගකීම් පෙළ ගැස්සීම. (පිටු අංක 90, 91)

(iv) ★ ස්වභාව සෞන්දර්ය විනාශ වීම වැළැක්වීම
★ පරිසරය දූෂණය වැළාක්වීම
★ පරිසරය සුරැකීම .............................යනාදී පිළිතුරු සලකන්න ( පිටු අංක 92)

II කොටස

04 (i) ★ සලමොන් රජතුමා විසින් නියෝග කරන ලද බදු බර අධික වීම
★ ඔහුගේ ගොඩනැගිලි ව්‍යාපාරයේ රාජකාරී සේවාවල යොදවන ලද විශාල පිරිසකගේ පෞද්ගලික නිදහස හා මානව අයිතිවාසිකම් සීමිත වීම.
★ ජෙරුසලම් පාලන තන්ත්‍රය ජුදා ගෝත්‍රයට ප්‍රමුඛතාවය දීම.
★ ජනතාව රෙහෙබෝවසම්ගෙන් සහනයක් බලාපොරොත්තු වීම.
★ කැරලිකරුවන්ගේ නායකත්වයට ජෙරබෝවාම් පත් වීම.
★ උතුරු දකුණු ලෙස රාජ්‍ය දෙකඩ වීම.

(ii) සිසුන් ලියා ඇති කරුණු සලකා ළකුණු ලබා දෙන්න.

05 (i) පිටුව 47

(ii) සිසුන් ලියා ඇති කරුණු සලකා ළකුණු ලබා දෙන්න.

06 (i)
- ★ ක්‍රිස්තුස්වහන්සේගේ මෙහෙයේ අරමුණුවලට අනුකූලව උන්වහන්සේ මෙහෙය වූ බව දැනවීම.
- ★ මානව සංහතියට පොදු ගැලවීම විශ්වීය සංකල්පයක් බව ඉදිරිපත් කරයි.
- ★ වෛද්‍යවරයෙකුගේ අත්දැකීම් සමගින් සුව කිරීම් පිළිබඳ විස්තර කරයි.
- ★ ග්‍රීක් භාෂා ශෛලිය
- ★ ග්‍රීක් ඉතිහාසඥයින්ට අදාල වාර්තා රටාවක් උපයෝගි කර ගැනීම (පිටු අංක 93,94)

(ii)
- ★ සුභාරංචිය කතුවරුන් හතරදෙනා පදනම් කරගෙන ක්‍රිස්තුන්වහන්සේ පිළිබඳ සිය කෘතීන් මගින් ඉදිරිපත් කර ඇති කරුණු සැළකිල්ලට ගෙන ළකුණු ලබා දෙන්න (පිටු අංක 87-96)

07 (i)
- ★ බටහිර අධිරාජ්‍යයේ බිඳවැටීම බටහිර කතෝලික සභාවේ බිඳ වැටීමටද හේතු වීම.
- ★ රෝම පාප්වරුන් හා ආදිපිතෘවරුන් අතර භේද ඇති වීම.
- ★ ඉස්ලාම් ආගම නැගෙනහිර සභාව යටපත් කිරිම.
- ★ මෙතෝඩියස් හා සිරිල් නැගෙනහිර යුරෝපයේ ගෂාර්ස් හා ස්ළැවීන් ගෝත්‍රික ජනතාව අතර කිතු දහම පැතිරවීම.
- ★ ස්ළාවින් ගෝත්‍රික ජනතාවට සිරිල්තුමා නව අක්ෂර මාලාවක් හදුන්වා දීම. (පිටු අංක 38)

(ii)
- ★...........තාපස නිකාය
- ★ කාර්තුෂියන් තාපස නිකාය
- ★ සිස්ටර්සියන් තාපස නිකාය
- ★ කාර්මේල් නිකාය
- ★ කැපුචින් නාකාය
- ★ වින්සෙන්තියානු නිකාය
- ★ ජේසු නිකාය (පිටු අංකය 39-49)

08 (i)
- ★ ලන්ඩන් ධර්මදූත කණ්ඩායම
- ★ බැප්ටිස්ට් ධර්මදූත කණ්ඩායම
- ★ වෙස්ලියන් ධර්මදූත කණ්ඩායම
- ★ ඇමරිකන් ධර්මදූත කණ්ඩායම
- ★ සභා ධර්මදූත සංගමය ( පිටු අංක 75)

(ii) කරුණු සහිතව සිසුවා ලියා ඇති පිළිතුරු අනුව ලකුණු පිරිනමන්න. (ලකුණු 10)


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න